**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 06 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 02 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.100,000 ක් වූ උප කාර්යාලීය ඉඩම සහ ගොඩනැගිල්ල ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව එකතුව රු.4,064,278 ක් වූ ඉඩම් 05 ක හා ගොඩනැගිල්ලක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |

| | | | |
|---|---|---|---|
| (iii) | පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.755,166 ක් වූ බේල් යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (iv) | පිළිසරු ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු හලර් යන්ත්‍රයේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (v) | 2016 වර්ෂයේ සිට පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබුණු ගොඩනැගිලි සහ ලබාදී තිබුණු පරිගණක හා වෙනත් උපකරණවල වටිනාකම රු.44,245,009 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාල වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (vi) | 2014 වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු රු.160,536 ක් වූ ගැල්වනයිස් කොඩිකණුවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් ගිණුම්ගත කිරිම කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (vii) | සභාව සතු රු 54,790,929.ක් වූ මෝටර් රථ හා කරත්ත 6ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි . | වත්කම් ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (viii) | සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වටිනාකම රු 400,647.ක් වැඩියෙන් දක්වා තිබුණි . | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ix) | පිළිසරු ව්‍යාපෘතිය සඳහා රු 4,731,400.ක් වැය කර ඉදිකර තිබුණු ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි . | වත්කම් ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (x) | සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවීය යුතු වියදම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර ටෙන්ඩර් තැන්පත් වටිනාකම ගිණුම හා තැන්පත් ලේඛනය අතර රු.82,500ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 06 ක් ඉක්මවූ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම් එකතුව රු.8,055,690 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ | ඉදිරිපත් කර නැත |
| (ii) | වසර 08 ක් ඉක්මවූ කාලයක සිට පැවත එමින් තිබුණු එකතුව රු.825,145 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i). | වටිනාකම රු.121,258,706 ක් ගිණුම් විෂයයන් 19 කට අදාලව වත්කම් ලේඛන, විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ සහ සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූලාා ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.200,680 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය තොගය බෙදා දුන් ආකාරය දැක්වෙන බෙදා හැරීම් ලේඛන සහ ප්‍රතිලාභ නාම ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය. | ඉටු කළ කාර්යයන් සනාථ කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| (i) | රීති 33 | වරිපනම් ගෙවීම පැහැරහරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදි පිළියෙල කර නොතිබුණි | රීති 33 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ii) | රීති 59 | සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | රීති 59 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (iii) | රීති 217හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කර නොතිබුණි. | රීති 217 හා 218 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මු.රෙ. 257 | සහතික කිරිමකින් තොරව වවුවර 11 ක් සඳහා රු.1,385,409 ක් ගෙවීම් කර තිබුණි. | වවුචර් සහතික කර ගෙවීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ. 571 | වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක් ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ<br>------------------------<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 07 ක් සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ඊ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරිපත් කර නැත |

## 02. මූල්‍ය සමාලෝචනය
-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,070,993 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,397,859 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,326,400 | 1,511,392 | 1,343,325 | 1,226,839 | 447,950 | 482,626 | 576,146 | 1,058,772 |
| කුලී | 5,074,600 | 3,851,465 | 3,546,771 | 7,051,995 | 5,127,800 | 4,744,588 | 2,002,713 | 6,747,301 |
| බලපත්‍ර ගාස්තු | 713,000 | 484,050 | 484,050 | 1,033,300 | 902,600 | 942,554 | 90,746 | 1,033,300 |
| වෙනත් ආදායම් | 28,053,940 | 51,240,865 | 49,658,263 | 5,064,468 | 28,876,500 | 17,037,886 | 13,556,020 | 3,481,866 |
| එකතුව | 35,167,940 | 57,087,772 | 55,032,409 | 14,376,602 | 35,354,850 | 23,207,654 | 16,225,625 | 12,321,239 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 12 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වන විට රුපියල් මිලියන 14 ක් වී තිබුණි. | හිග ආදායම් රැස්කිරිමට කටයුතු කල යුතු වේ | ඉදිරිපත් කර නැත |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 සහ 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන චක්‍රලේඛය පරිදි වසර 05කට වරක් කඩ කාමර තක්සේරුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කඩකාමර නව තක්සේරුවක් සිදුකර අදාල තක්සේරු මත කුලී අයකිරිමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) | පොදු වෙළඳපොළ කඩ කාමර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරු මත ගිවිසුම් අත්සන් කිරිමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජුලි සිට දෙසැම්බර් දක්වා නිකුත්කර තිබුණු වැලි ප්‍රවාහන බලපත්‍ර ලිපි අනුව කියුබ් 139,775 ක් සඳහා රු 20,966,250.ක ආදායමක් ලැබිය යුතුව තිබුණු නමුත් කුවිතාන්සි අනුව කියුබ් 132,73ක් සඳහා රු 19,909,700.ක ආදායමක් ලැබී තිබීම නිසා කියුබ් 7,043 ක් සඳහා රු 1,056,550.ක්වූ අඩුවෙන් ලැබී තිබුණි. | ලැබිය යුතු ආදායම් අයකර ගත යුතුවේ. | ඉදිරිපත් කර නැත |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,502,143 ක් සහ මුද්දර ගාස්තු රු.3,198,025 ක් විය. | අදාල හිග මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණය විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවිම කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කසල කළමණාකරනය විධිමත්ව සිදුකර නොතිබුණු අතර එකතු | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කර අලෙවිකර | ඉදිරිපත් කර නැත |

| | |
|---|---|
| කරනු ලැබූ දිරන ද්‍රව්‍ය වලින් පොහොර නිෂ්පාදනය සිදුකර අලෙවි කර ආදායම් කිසිවක් උපයාගෙන නොතිබුණි. | ආදායම් රැස්කර ගැනීමටත් ඝන අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීමටත් ක්‍රමවේදයක් ඇති කලයුතු වේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 අනුව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යන්ත්‍ර කුලි පදනම මත ලබාදිමේදී ලේඛනවල සටහන් කර ලබාදි නොතිබුණු අතර අදාල කාර්ය සිදුකල මීටර් පැය ගණන හෝ කිලෝමීටර් ගණන තාක්ෂණ නිලධාරීන් විසින් සහතික කර නොතිබුණි. | අනුමැතිය සහිතව යන්ත්‍ර ලබාදීම, යන්ත්‍ර බැහැර යාමේදි හා පැමිණිමේදි පවතින යන්ත්‍ර පැය මත ගාස්තු අයකිරිමට කටයුතු කිරිම,ලේඛන විධිමත්ව පවත්වාගෙන යාම ආදිය කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ තනතුරු 11 ක් සේවක පුරප්පාඩු 19 ක් පැවති අතර අතිරික්ත තනතුරු 02 ක් පැවතුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) | සභාවේ ඇප තැබිය යුතු සියළුම නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරින්ගේ ඇප මුදල් ලබා ගැනීම සඳහා කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 සහ 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන චක්‍රලේඛය පරිදි වසර 05කට වරක් දේපල තක්සේරු කල යුතු වුවද ප්‍රාදේශීය සභාව විසින් 1994 වර්ෂයේ දේපල තක්සේරු කිරීමෙන් අනතුරුව දේපල තක්සේරුවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර නව ඉදිකිරීම් හදුනාගෙන එම දේපල සඳහා වරිපනම් අය කිරිමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දේපල තක්සේරු කිරිමට පියවර ගතයුතු අතර නව ඉදිකිරීම් සම්බන්ධව තාවකාලික තක්සේරු මත වරිපනම් අයකිරිමට පියවර ගත යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් නඩත්තු කරනු ලබන ඉඩම් 14 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉඩම් පවරා ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |

3.5.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 වර්ෂයේදී සභාව වෙත ලැබුණු රු.2,175,000 ක් වටිනා ට්‍රැක්ටරය 2016 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | අදාල ට්‍රැක්ටරය පිළිබඳ පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. | ඉදිරිපත් කර නැත |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභා පරිශ්‍රයේ රඳවා තිබෙන වාහන 07 ක් අක්‍රීය තත්වයේ පවතින අතර මෙමම වාහන | අදාල වාහන පරීක්ෂා කර අළුත්වැඩියාවට හෝ අපහරණය කිරිමට කටයුතු කළයුතු වේ. | ඉදිරිපත් කර නැත |

| | | |
|---|---|---|
| අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | | |

3.6 ප්‍රසම්පාදනය

---------------

ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙළ කළ යුතු වේ. | ඉදිරිපත්කර නැත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවරි 28 දිනැති අංක DMA/ 2009 (1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ඉදිරිපත් කර නැත |